# කොළඹ විශ්ව විද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශාස්ත්‍ර පීඨය

## ශාස්ත්‍රවේදි තෙවන වසර දෙවන සෙමෙස්තර වාර අවසාන පරීක්ෂණය
## (Banking and Finance Study Stream) – 2016 /2017
## ECN 3267 මහ බැංකුකරණය සහ මූල්‍ය පරිපාලනය
## කාලය - පැ දෙකයි (02)

**ඕනෑම ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න.**
**පිළිතුරු පැහැදිලිවත්, ප්‍රශ්නයට අදාළවත් කෙටියෙන් ලියන්න.**

1.

I. බැංකු ආයතන ව්‍යුහය (Banking Structure) යන්නෙන් ඔබට වැටහෙන්නේ කුමක්දැයි විස්තර කරන්න. (ලකුණු 6)

II. "බැංකු ආයතන ව්‍යුහය රටින් රටට වෙනස් විය හැකිය. ආර්ථිකයේ සංවර්ධන අරමුණු සමග බැංකු ආයතන ව්‍යුහය බද්ධ වී ඇත." මෙම ප්‍රකාශනය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු7)

III. ශ්‍රී ලංකා ආර්ථිකයේ තත්කාලීන බැංකු ආයතන ව්‍යුහය වේගවත් ආර්ථික වර්ධනයකට සුදුසුයැයි ඔබ සිතනවාද? ඔබගේ පිළිතුර විස්තර කරන්න. (ලකුණු7)

2.

I. අවදානම (Risk) යන්න ඔබ විස්තර කරන්නේ කෙසේද? (ලකුණු 5)

II. "බැංකු ව්‍යාපාරය අවදානම් දැරීම හා තදින් සම්බන්ධ වී පවතී." මෙම ප්‍රකාශය විස්තර කරන්න. (ලකුණු 7)

III. බංකු ආයතන මුහුණ දෙන අවදානම් වර්ග මොනවාද යන්න පැහැදිලිව විස්තර කරන්න. (ලකුණු 8)

3.

I. "බැංකු ආයතන සාම්ප්‍රදායික බැංකු කටයුතුවල සිට විවිධ ආකාරයේ ව්‍යාපාර කටයුතු දක්වා විකාශනය වී ඇත." මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න. (ලකුණු 6)

II. නූතන දියුණුතාක්ෂණය සහ නවතම මූල්‍ය උපකරණ හේතුවෙන් වාණිජ බැංකු විසින් සිදු කරන මූල්‍ය අතරමැදිකරණ (Financial intermediation) කටයුතුවල වැදගත්කම අඩු වෙනවා යැයි ඔබ සිතනවාද? ඔබෙ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 7)

III. වාණිජ බැංකු කටයුතු වෙනස් වීමට බැංකු නොවන ආයතනවල (Non-Bank Financial Institutes) වර්ධනයහේතු වී ඇති යැයි ඔබ දකිනවාද? ඔබගේ පිළිතුර විස්තර කරන්න. (ලකුණු 7)

4.

I. "යම් ආර්ථිකයක මූල්‍ය පද්ධතිය (Financial System) අවස්ථා තුනක් (Three Phases) පසු කර පරිනාමණය වන බවට ආර්ථික විශ්ලේෂකයින් තර්ක කරනු ලබයි."එම පරිණාම අවස්ථාවන් මොනවාද යන්න විස්තර කරන්න. (ලකුණු 7)

II. ශ්‍රී ලංකාවේ මූල්‍ය ක්‍රමය ඉහත පරිණාම අවස්ථා අනුව විස්තර කල හැකිද? ඔබගේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 7)

III. වාණිජ බැංකු, ශේෂ පත්‍රයෙන් පරිබාහිර ව්‍යාපාර (Off-Balance Sheet Activities) කටයුතුවලට යොමු වීම මෙම පරිණාමයේ ප්‍රතිඵලයක් ලෙස ඔබ සිතනවාද? ඔබගේ පිළිතුර විස්තර කරන්න. (ලකුණු6)

5.

I. ජාත්‍යන්තර මූල්‍ය වෙළඳපොළක් (International Financial Market) යනු කුමක්ද? එවැනි මූල්‍ය වෙළඳපොළක ලක්ෂණ ඉදිරිපත් කරමින් ඔබගේ පිළිතුර විස්තර කරන්න. (ලකුණු6)

II. ඔබ අධ්‍යනය කර ඇති ප්‍රධාන මූල්‍ය වෙළඳපොළ වර්ග විස්තර කරන්න. (ලකුණු7)

III. ජාත්‍යන්තර මූල්‍ය වෙළඳපොළවල ඔබ අධ්‍යනය කර ඇති මෑත කාලීන වර්ධනයන් විස්තර කරන්න. (ලකුණු7)

6.

I. මහ බැංකුවක (Central Bank) වැදගත්කම එහි ප්‍රධාන කාර්යන් අනුසාරයෙන් විස්තර කරන්න. (ලකුණු6)

II. මහ බැංකුවක ප්‍රධාන වත්කම් සහ බැරකම් මුදල් සැපයුමට ඇති කරන බලපෑම විග්‍රහ කරන්න. (ලකුණු7)

III. "මහ බැංකුවක ස්වාධීනත්වය මූල්‍ය පරිපාලනය පහසු සහ කාර්යක්ෂම කරනු ලබයි." මෙම ප්‍රකාශය විස්තර කරන්න. (ලකුණු7)

7.

I. මූල්‍ය ප්‍රතිපත්තිය ආර්ථික කටයුතු කළමනාකරණයට වැදගත් වන්නේ කෙසේද යන්න විස්තර කරන්න. (ලකුණු6)

II. මූල්‍ය ප්‍රතිපත්තිය සහ ආර්ථික කළමනාකරණය පිළිබඳ සම්බන්ධය මූල්‍ය ගුණක ප්‍රවේශය අනුසාරයෙන් විස්තර කරන්න. (ලකුණු7)

III. මූල්‍ය ගුණක ප්‍රවේශය වඩාත් කාර්යක්ෂම මූල්‍ය පරිපාලනයකට උපකාර වනවාද යන්න විභාග කරන්න. (ලකුණු 7)

8.

I. "මූල්‍ය ප්‍රතිපත්ති අරමුණු එකිනෙකට තරගකාරී බැවින් මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සංකීර්ණ ක්‍රියාවලියකි." මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න. (ලකුණු6)

II. මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට මහ බැංකුව විසින් උපයෝගී කර ගන්නා ක්‍රමවේද පැහැදිලිව විස්තර කරන්න. (ලකුණු7)

III. එම ක්‍රමවේදවල ගුණාගුණ අනුසාරයෙන් වඩාත් කාර්යක්ෂම සහ ප්‍රචලිත ක්‍රමවේදය කුමක්දැයි පෙන්වා දෙන්න. (ලකුණු7)

9.

I. බැංකු පරිපාලනය ශක්තිමත් සහ ක්‍රමවත් බැංකු ව්‍යාපාරයක් සඳහා අත්‍යවශ්‍ය කොන්දේසියක් බව ඔබ සිතනවාද? ඔබගේ පිළිතුර විස්තර කරන්න. (ලකුණු6)

II. බැංකු පරිපාලනය පිළිබද BASEL සම්මුතිය යනු කුමක්ද? (ලකුණු7)

III. BASELසම්මුතිය ක්‍රමිකව විකාශනය වී ඇති ආකාරය එහි අඩංගු වී ඇති පරිපාලන විධික්‍රම අනුසාරයෙන් විස්තර කරන්න. (ලකුණු7)

*******************